# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1371 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 01/11/2023 පැය 1540

# මාධ්‍ය නිවේදනය

**01. විදේශ රැකියා ලබා දෙන බවට පවසා මුදල් වංචාකල සැකකරුවකු අත්අඩංගුවට - පොළොන්නරුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2023.10.29 වන දින පොළොන්නරුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරින් කණ්ඩායමක් විසින් අත් අඩංගුවට ගන්නා ලද සැකකරුවෙකු සම්බන්ධයෙන් සිදුකල විමර්ශනයේ දී දිවයිනේ විවිධ ප්‍රදේශවල පුද්ගලයින්ට විදේශ රැකියා ලබා දෙන බව පවසා මුදල් වංචා කිරීමක් සම්බන්ධයෙන් අවශ්‍ය කරන සැකකරුවෙකු ලෙස අනාවරණය කරගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුට එරෙහිව හලාවත, ගනේමුල්ල, වැලිකඩ, මීගොඩ, ආනමඩුව, කඩවත, පිළියන්දල සහ කුරුණෑගල යන පොලිස් ස්ථාන වෙත මෙවැනි වංචාකිරීම් සම්බන්ධ පැමිණිලි 14 ක් වාර්තා වී ඇති අතර, රුපියල් මිලියන 10 කට අධික මුදලක් වංචා කර ඇති බවට දැනට සිදුකළ විමර්ශනවලදී අනාවරණය වී ඇත.

සැකකරුට පානදුර ගරු මහේස්ත්‍රාත් අධිකරණය මගින් වරෙන්තු 10 ක් නිකුත් කර ඇති අතර, පානදුර ගරු මහාධිකරණය මගින් එක් වරෙන්තුවක් නිකුත් කර ඇත. සැකකරු 2023.10.31 වන දින පානදුර ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2023.11.14 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත. පොලොන්නරුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය මාතලේ ඒකකය.**

2023.10.31 වන දින සවස් කාලයේ මාතලේ පොලිස් වසමේ මාතලේ නගරයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ මාතලේ ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 307 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මාතලේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 57 ක් වන මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ මාතලේ ඒකකය සහ මාතලේ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**03.** **නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බුලත්සිංහල පොලිස් ස්ථානය.**

2023.10.31 වන දින රාත්‍රි කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ කොටපන්විල ප්‍රදේශයේදී බුලත්සිංහල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 52.5 ක් (බෝතල් 70)** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 39 ක් වන බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බුලත්සිංහල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**